# ශ්‍රී ලංකාවේ පාරිසරික නීති

නීති පති

සුනිල් සී ද සිල්වා

පරිසරය සුරැකීම කෙරෙහි කෙළින් ම ක්‍රියාත්මක වන වනසත්ව හා වෘක්ෂලතා ආඥාපනත වැනි ව්‍යවස්ථා හතළිහක් පමණ සහ පරිසර විෂය කෙරෙහි අනියම් ලෙසින් ක්‍රියාත්මක වන නාගරික සංවර්ධන අධිකාරිය වැනි තවත් පණහක පමණ සංඛ්‍යාවක් ද අප ශ්‍රී ලංකාවෙහි නීතිගත කොට ඇත. ඒ තරම් සංඛ්‍යාවක් ව්‍යවස්ථා පනවනු ලැබ තිබිය දී නීති ගැන වැටහීමක් නැති කමත් ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳ උදාසීනතාවත් නිසා පරිසරය සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවත් නොසැලසී ඇත.

පරිසරය සම්බන්ධයෙන් වන ස්වකීය අයිතීන් ආරක්ෂා කර ගැනීම සඳහා නීතියේ ඇතුළත් විධිවිධාන මහජනතාව අතරින් බොහෝ දෙනෙක් නොදනිති. පරිසරයට අදාළ සරල ගැටලු මඟ හරවා ගැනීම සඳහා අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 98 වැනි වගන්තියේ විධිවිධාන (පීඩා නතර කිරීම්) හෝ පොලිස් ආඥාපනතේ 63 වැනි වගන්තියේ විධිවිධාන හෝ ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත හැකි වේ. එහෙත්, මහජනයා මෙකී විධිවිධාන වලින් ප්‍රයෝජන ගැනීමට නැඹුරුවීමේ අවස්ථා විරල ය. නිසැකවම, මීට හේතුව එක්කෝ මෙකී විධිවිධාන ගැන නොදැන සිටීම නැත හොත් ඔවුන් තුළ ප්‍රජා හැඟීමක් නැති වීම විය යුතු ය.

ප්‍රජාව ගැන තැකීම අඩුවීම දෙයාකාරය කින් සිදුවේ. එක් අතකින්, කසළ හෝ ඉවතලන ද්‍රව්‍ය බැහැර දැමීමේ දී මිනිසුන් ආත්ම සංයමයක් ඇතිව ක්‍රියා කළ යුතුය යන අවශ්‍ය තාවට ගරු නොකොට, පරිසරය දූෂණයවීම කෙරෙහි තැකීමක් නැතිව ඒවා තමන්ට පහසු කිට්ටුම තැනකට විසි කරනු ලබයි. අනෙක් අතට, වෙනත් අය මෙවැනි හානිකර දේ සිදු කරන බව දන්නා අය වුව ද, සමහර විට ඒවා තමන්ට පෞද්ගලික වශයෙන් බලපාන්නේ නැත්නම් ඒ ගැන විරෝධය පෑම, විරුද්ධත්වය දැක්වීම හෝ බලධාරීන්ට පැමිණිලි කිරීම තමන්ගේ යුතුකමක් කොට නොසළකති.

අපරාධ නඩු පැවරීම හැරුණු විට, පරිසරයට උවදුරක් සිදු විය හැකි හෝ ඇතිවිය හැකි අන්දමට පරිපාලන බලධාරීන් විසින් යම් තීරණයක් ගනු ලැබූ විට පරි පාලකයාගේ එකී තීරණය බල රහිත කරනු පිණිස හෝ පරිසරයට හානිකර යම් පියවරවල් ඉවත් කැරෙන යම් ක්‍රියාවක් කිරීමට ඔහුට බල කරනු පිණිස හෝ සර්ටියෝරාරි ආඥාවක් නැතහොත් මැන්ඩාමුස් ආඥාවක් මඟින් එකී තීරණය අභියෝගයට ලක් කළ හැකිය. මේ විධිවිධාන ප්‍රයෝජනයට ගනු ලබන්නේ බොහෝ කලාතුරකින් වන අතර, තහනම් නියෝග ලබා ගැනීම සඳහා අධිකරණයෙන් ඉල්ලා සිටින අවස්ථා ද විරල ය.

තවමත් සංවර්ධනය වෙමින් පවත්නා රටක් හැටියට, දීර්ඝ කාලීනව ප්‍රයෝජන බලාපොරොත්තුවෙන් කෙටි කාලීන වශයෙන් කැප කිරීම් සිදු කළ යුතු වීමේ උග්‍ර ගැටලුව කට අපි ද මුහුණ පා සිටිමු. මතු කාලයේ දී වෙරළ ආරක්ෂා කර ගැනීමේ අටියෙන්, හිරිගල් කැඩීම වැනි ධනෝපායන කටයුතුවලින් වැළකී සිටින ලෙස අන්ත දුප්පත් මිනිසකුට අප වටහා දෙන්නේ කෙසේ ද?

පාරිසරික නීති ඵලදායි ලෙස යොදා ගැනීමට බාධාවක්ව පවතින තවත් සාධකයක් නම් ඒවා ක්‍රියාවේ යෙදවීම හා සම්බන්ධිත නිලධාරීන්ට දැනුම හෝ අවබෝධය නොමැති වීමයි. නීතියේ ඇති විධිවිධාන ප්‍රමාණවත් නොවන අවස්ථා වගකිවයුතු බලධාරීන්ගේ අවධානයට යොමු නොකිරීමට මෙකී දුර්වලතාව ද හේතුවී ඇත.

නිදසුනක් දක්වතොත් වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂා ආඥාපනත අවසන්වරට සංශෝධනය කරන ලද්දේ 1970 දී වන අතර, එය ද රෙගුලාසි මඟිනි. වැරදි සඳහා නියම කරනු ලැබ ඇති දඩ මුදල් උද්ධමනයට නො සරිලන අතර, අද තත්ත්වය සැළකිල්ලට ගැනීමේ දී කිඹුල් හෝ දිවි සම් හෝ ඇත් දත් විකිණීමෙන් ලබාගත හැකි අති විශාල ලාභයත් එබඳු සතුන් දඩයම් කිරීම අල්ලා ගනු ලබන විට දඩ වශයෙන් නියත කරනු ලබන සුළු මුදලක් ගැන සළකන විට මේ අවදානම බාර ගැනීම නරක නැතැයි සිතන තත්ත්වය ඇති වේ.

හොරෙන් ඇතුන් දඩයම් කිරීම සම්බන්ධ යෙන්, නීතියෙන් රු. 1,000/- කට සීමාවී ඇති දඩය ගැන අපි සිතමු. විවෘත වෙළඳ පොලේ රු. 2,00,000/- කට අධික මුදලක් ලබාගත හැකි ඇත් දළ ජෝඩුවක වටිනාකම එසේ නියම කළහැකි දඩය සමග සංසන්දනය කරන්න.

සංශෝධනයකින් නිවැරදි කිරීමට අපේක්ෂිත අයහපත කෙරෙහි බලපවත්වන අන්දමට එකී සංශෝධනයේ පද යෝජනය විය යුතු ය. යන අර්ථනිරූපන රීතිය විනිශ්චය කාරවරුන් විසින් අනුගමනය කරන ලද වගක් නොපෙනෙන බව නීතිපති - එරෙහිව මානවඩු නඩුවේ තීරණය වැනි තීරණවලින් හෙළි වන බව ද පෙන්වා දිය යුතු ය. වුදිතයාගේ යහපත උදෙසා විහිදුවිය හැකිතාක් දුරට නීතිය පුළුල් කිරීම හොදය; උතුම්ය; එමෙන්ම සාම්ප්‍රදායික ය. ඒ අතරම, වෙන් කරන ලද වන බිම් නීති විරෝධී ලෙස විනාශ කිරීමෙන් උපදින්නට සිටින ඉදිරි පරම්පරාවලට සිදු වන පිරිමසාලිය නොහැකි හානිය ගැන අප සැළකිල්ල යොමු නොකළ යුතු ද?

අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන කිසිදු ගසක් කැපීම තහනම් කැරෙන ගස් කැපීම (පාලනය කිරීම) පිළිබඳ පනත යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ ඇත්තේ එක් ගසක් පමණි. එනම් කොස් ගස පමණි. ඉන් පසුව, මේ පනත මතකයෙන් ඉවත්ව ගොස් ඇති සේ පෙනේ.

තවත් අංශයක් නම්, ආර්ථික සහ පාරිසරික දියුණුවත් සමග එක්ව යන සේ පැරණි නීති සහ රෙගුලාසි යාවත්කාල නොකිරීම සහ ඒ හේතුවෙන් ඇතැම් ව්‍යවස්ථාපිත නීති අභාවයට යාමයි. නිදසුනක් ගතහොත්, පුද්ගල සන්තකයේ ඇති ඇත් දළ පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන යාමට වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂා ආඥා පනතෙන් විධිවිධාන නියමය ගනිමු. යම් තැනැත්තෙකු මධ්‍යම ගනු ලැබ ඇත.

පරිසරය සුරැකීමේ අවශ්‍යතාව අවදි කිරීම සඳහා පසුගිය දශකය තුළ දී නා නා සංවිධාන සහ කණ්ඩායම් විසින් අමිල සේවයක් සලසන ලද අතර, පරීක්ෂාකාරීව සැලසුම් කරන ලද ව්‍යවස්ථා නීතිගත වූ අයුරුත් එසේ නීතිගත වූ ව්‍යවස්ථා වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපාරයත් අපට දක්නට ලැබුණි. විදේශ ව්‍යවස්ථාවන්හි ඇතුළත් විධිවිධාන මේ ව්‍යවස්ථාපික නීතිවලට ඇතුළත් වී ඇති බව දක්නට ඇත. මීට හොඳම නිදසුන් වශයෙන් වෙරළ සංරක්ෂණ පනතෙහි අන්තර් ගත පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ කාර්යය පටිපාටිය, රටේ පාරිසරික නීති පිළිබඳ ඉහළින් කැපී පෙනෙන ව්‍යවස්ථාව සේ සැළකෙන, (1988 දී සංශෝධිත) 1980 අංක 47 දරන ජාතික පරිසර පනත, කැලෑ ආඥාපනතට සහ ජාතික සහ වනගත පෙදෙස් පනතට කරන ලද සංශෝධන ද දැක්විය හැකි ය.

එනෙකුදු වුවත්, අප තවමත් සිටින්නේ අප සිටිය යුතු තැනට බොහෝ දුරිනි. මෙකී නීති ක්‍රියාවේ යෙදවීමට ප්‍රතිව්‍යුහයක් අප තවම තනා නැත. ජාතික පරිසර පනත සඳහා 1990 ජූලි මාසයේ ගෙන එන ලද රෙගුලාසි මඟින් ක්‍රියාත්මක කරනු ලැබූ බලපත්‍ර ලබා ගැනීමේ නියමය ගනිමු. යම් තැනැත්තකු මධ්‍යම පරිසර අධිකාරියේ බලපත්‍රයක් ලබා නොගෙන පරිසරය තුළට යම් අපද්‍රව්‍යයක් පිට කිරීම වරදකි.

රට තුළ යම් සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රථම බලපත්‍රයක් ලබා ගනු පිණිස සියලු දේපල සංවර්ධකයන් පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුවක් ඉදිරිපත් කළයුතු බව පාරිසරික බලපෑම් තක්සේරුවෙන් නියම කෙරේ. සංවර්ධකයකු විසින් ඉදිරිපත් කැරෙන යම් බලපෑම් තක්සේරුවක් ගැන විරුද්ධත්වය පළ කිරීමට මහජනයාට හැකි වන විධිවිධාන ද සැලසී ඇත.

බලපත්‍ර අවශ්‍ය ඒවා සේ කර්මාන්ත 5000 ක් පමණ මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුනා ගනු ඇත. මේවායින් 250 ක් පමණ දැඩි පරිසර දූෂණයක් ගෙන දෙන කර්මාන්ත ලෙස හඳුනා ගනු ලැබ ඇත. මේ සියලු ස්ථාන පරීක්ෂාවට භාජනය කරනු සඳහා ප්‍රතිව්‍යුහ සකස් කැරෙන තුරු නීතිය ක්‍රියාත්මක කිරීම අවශ්‍යයෙන්ම කල් දැමිය යුතු ය.

සංශෝධනයක් මගින් සහ ගැසට් නිවේදනය කින් පනවන ලද රෙගුලාසි මගින් කැලෑ ආඥා පනත යාවත්කාල බවට පත් කරනු ලැබ ඇත. කෙසේවතුදු, ආදායම් උපයන ක්‍රියා මාර්ගයක් ලෙසට මුල ද නීතිගත කරනු ලැබූ මේ ආඥා පනතින් සංරක්ෂණය සඳහා වූ ව්‍යවස්ථාවක කාර්‍යය භාරය ඉටු නොවේ.

බාධාකර වන තවත් අංශයක් නම්, පරිසර ආරක්ෂාව පිළිබඳ ක්ෂෙත්‍රය තුළ එකක් මත එකක් එකවිට ජනිත වන අන්දමේ අධිකරණ බලයක් සහිත විවිධ ආයතන අතර සම්බන්ධී කරණයක් නැතිකමයි. මීට අදාළව දැක්විය හැකි කරුණක් නම් පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ අවශ්‍යතාව ජාතික පරිසර පනත සහ වෙරළ සංරක්ෂණ පනත යන දෙකෙහි ඇතුළත් වේ. මේ ආයතන දෙකින් කවරකට හෝ තක්සේරුව ඉදිරිපත් කොට බලපත්‍රය ලබාගත හැකි ද නැතහොත් ආයතන දෙකෙන්ම එය ලබාගත යුතු ද යන්න පිළිබඳ අවුල් සහගත තත්ත්වයක් මේ නිසා මතු වී ඇත.

මෙසේ අනිච්ඡේදනය වන (එකක් මත එකක් ක්‍රියාත්මක වන) අධිකරණ බලය හේතු වෙන් එක් ආයතනයක් අනෙක් ආයතනය වෙත වගකීම පැටවීමට මාන බලන අතර, එයින් හානි සිදුවන්නේ පරිසරයේ ආරක්ෂාවටයි. සිංහරාජ අඩවියට අයත් බල ප්‍රදේශය සම්බන්ධයෙන් මෑත දී වනසත්ව දෙපාර්තමේන්තුවත් කැලෑ දෙපාර්තමේන්තුවත් අතර පැවති කඹ ඇදිල්ල සළකා බලන්න.

අපට බැසිය හැකි නිගමනය වන්නේ ශක්ති මත් කළ යුතු බොහෝ අංශ මේ විෂය තුළ තිබෙන බව ය. මහජනයාත්, පරිසර ආරක්ෂාවට අදාළ නීති ක්‍රියාවේ යෙදීමේ වගකීම උසුලන නිලධාරීනුත්, අතර දැනට වඩා අවබෝධ යක් තිබිය යුතුය.

අධික නීති සංඛ්‍යාව, ද්විත්වකරණයක් අනිච්ඡේදනයත්, වළක්වාලීම සඳහා සුපරීක්ෂා කාරී අධ්‍යයනයකට භාජනය කළ යුතුවන අතර, ඇතැම් විට ඒකාබද්ධ කළයුතු ද වේ. විෂයයට සම්බන්ධිත හෝ අදාළ විවිධ දෙපාර්තමේන්තු වඩාත් හොඳින් සම්බන්ධී කරණය කළ යුතුය.

පසුගිය වසරේ පිහිටුවන ලද පරිසර අමාත්‍යාංශය මගින් මෙකී සියලු ප්‍රශ්න වලට විසඳුම්ද රට තුළ පරිසර සංරක්ෂණ කටයුතු වල යෙදී සිටින විවිධ ආයතන අතර වැඩි සම්බන්ධීකරණයක් ද ඇති වේ යයි අපි බලාපොරොත්තු වෙමු.